පූර්වකව සිහි කරන්න කැමතියි. එමෙන්ම මෙම ප්‍රසංගය නැරඹීමට මාර්තු 27 වන දා අප හා එක්වන මෙන් මා ඔබ සියලු දෙනාගෙන්ම ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා" කියා ය.

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ ආදි ශිෂ්‍ය සංගමයේ ඕනෑම කලා කටයුත්තක දී බොහෝ විට පුරෝගාමීව කටයුතු කරන ගාමිණී රණසිංහ ඉතා වෙහෙස ගෙන පුහුණු වීම් කරවන ආකාරය මට දකින්නට ලැබුණි. ප්‍රසංගය පිළිබඳ ඔහු මෙසේ අදහස් දක්වමින් -එදා 1996 දී අප සංගමයේ හිටපු සභාපතිවරයකු වන කරුණානන්ද අන්තෝනිගේ මහතාගේ යෝජනා-වක් පරිදි ආරම්භ කළ මේ ප්‍රසංගය එදා මෙල්බන් රසික ජනතාව ඉතා ආදරයෙන් වැළඳ ගත්තා. ඉතා සීමිත ජන කොටසක සීමිත සම්පත් මැද බිහි වූ මේ ප්‍රසංගය ක්‍රමයෙන් කාලානුරූපව වෙනස් වන්නට පටන් ගත්තා. එදා මෙදා තුර අප මව්බිමෙන් සංක්‍රමණය වූ ඉතා විශාල ජන කොටසක් සමග මෙහි පැමිණි නොයෙකුත් කලා කාමී ජනතාව නිසා මෙහි වෙසෙන ජන කොටසට ඉතා ඉහළ මට්ටමේ නිර්මාණ දැක බලා ගැනීමට වාසනාව ලැබුණා පමණක් නොව නිර්මාණයක් එළි දැක්වීමේ දී ඉතා ඉහළ තත්වයේ නිර්මාණ කිරීමට අප නිතැතින්ම යොමු වුණා කීවොත් නිවැරදියි. මෙම ප්‍රසංගයේදීද අපි ඒ අභියෝගයට සාර්ථකව මුහුණ දී ඇති බව මගේ හැඟීමයි. එපමණක් නොව ඉතා කාලීන අවශ්‍යතාවක්ව තිබී ආරම්භ කළ ගිම්හාන රංගන ප්‍රසංගයේදී අපි දෑතින් ඔසවා තැබ දරු දැරියන් දැන් නොයෙකුත් අන්දමේ දක්ෂ ශිල්පීන් ශිල්පිනියන් ලෙස ඉතා දුර ගමනක් ගොස් ඇති බව දක්නට ලැබීම සතුටක්. ඒ වගේම එදා අප වේදිකාවේ නොයෙකුත් ශිල්ප දැක් වූ වැඩිහිටියන් අද වෘත්තිය මට්ටමේ ශිල්පීන් සමග අපහසුවකින් තොරව එකතු වී කටයුතු කරන්නේත් මෙම ගිම්හාන රංගන වේදිකාව තුළින් පසුගිය කාලාන්තරය තුළ ලබා ගත් අත්දැකීම් තුළින් බව කිව යුතුයි. ඒ වගේම මෙල්බන් පුර ඉතා දක්ෂ ගුරු මහත්ම මහත්මීන්ගේ නර්තන පාසල් වල ඉගෙනුම ලබන අපේ දරු දැරියන් ඉතා ඉහළ මට්ටමේ නර්තන කීපයක් ද මෙම ප්‍රසංගයේ දී ඉදිරිපත් කරන බවත් කිව යුතුයි. කවදත් ප්‍රසංගය ඉදිරිපත් කිරීමේදී නැවුම් බවකින් ඔබ වෙත එන මෙම ප්‍රසංගය මෙවරද එම අභියෝගය බාරගෙන එකම වේදිකාව තුළ පසුතල නිර්මාණ තුන් ආකාරයකින් ඔබේ අවධානය වෙනස් කිරීමේ අභියෝගයත් ඔබට දැක ගන්නට ලැබේවි."

ඉතා කැපවීමෙන් බොහෝ දෙනෙකු එකතුව ඉදිරිපත් කරන ගිම්හාන රංගන ප්‍රසංගය දැක බලා ගැනීමට මාර්තු 27 වන දා බෙසන් සෙන්ටර් රඟහලේදී අප සමග එක්වන මෙන් ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ ආදි ශිෂ්‍ය සංගමය වෙනුවෙන් මම ඔබ සියලු දෙනාටම ආරාධනා කරමි.

සන්නස

# මංමුලා වූවෝ

## සුජීවා ලෝගුස්

කුරිරු යුද්ධයේ නිමාව පසුගිය වසරේ මැයි මාසයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ මඟ පෙන්වීම මත සිදුවිය. එද සිට මාස කිහිපයක් යනතුරු

*සිරිල් ධර්මවර්ධනට කුල බලල්ල, කොළ කොට්ටි බටලන්ද වධකාගාරය අමතක වූයේ කොහොමද?*

දෙස් විදෙස් සිටින සියලු ශ්‍රී ලාංකිකයන්ට පෙනුනේ ඔහුව රජෙකු ලෙසය. රට බේරාගත් මහා වීර වරයෙකු ලෙසය. එතුමා වෙනුවෙන් ගී පවා නිර්මාණය විය. කැවුම් කිරිබත්, විදියක් විදියක් පසා ඉදුනි.

විජයග්‍රහණයෙන් මාස කිහිපයක් ගතවූ පසු ජනාධිපතිවරණයට සියල්ල සූදානම් විය. වැඩි වූ වාර ගණනකින් පරාජයේ කිරුල පලන් රනිල් වික්‍රමසිංහ විපක්ෂ නායකතුමා විරුද්ධ පක්ෂයෙන් ජනාධිපතිවරණයට ඉදිරිපත් කිරීමට පක්ෂයේ ප්‍රබල සාමාජිකයන්ගේ විරෝධය පලවුයේය. එයට විසඳුමක් ලෙස පොදු අපේක්ෂයකු ලෙස හිටපු හමුදාපති සරත් පොන්සේකා තරග පිටියට පැමිණියේ හංසාලකුණින් එ.ජා.ප.යේ පාටටත් ලාංඡනයටත් මඳ විරාමයක් තබමිනි. මෙම පොදු සන්ධානයේ තවත් ප්‍රබලතම චරිතයක් වූයේ සෝමවංශ අමරසිංහයි. රනිල් සෝමවංශ දෙදෙනා රයිගමයයි ගම්පලයයි සේ සරත් පොන්සේකා මහතාගේ ජයග්‍රහනය උදෙසා කටයුතු කලේ ඔවුනොවුන්ගේ ප්‍රතිපත්ති, ලැජ්ජා නැතිකම හංසයා සමග දියේ පාකර හරිමිනි. මෙයට හේතුව රනිල් වික්‍රමසිංහ මහතාට ලැජ්ජාවක් නැතිකමද? එසේත් නැතිනම් සෝමවංශට මුල් අමතක වීම දැයි අපි නොදනිමු.

කෙසේ වෙතත් වෙරි දේශපාලනයේ ආරම්භකයන් මෙන්ම මිනිමරු දේශපාලනයේ නිර්මාතෘවරුන් වන්නේද එ.ජා.ප. ත් ජනතා විමුක්ති පෙරමුණත් බව නොරහසකි. ඒ මන්ද 1988, 1989, 1990, වකවානුවේදී එ.ජා. පක්ෂිකයින් අමු අමුවේ මරා දැමුවේත් ජනතා විමුක්ති පෙරමුණේ නායකයා ඇතුළු සාමාජිකයින් මරා දැමුවේත් මෙම එ.ජා. පක්ෂය බලයේ සිටින විටදීය. ජනතා විමුක්ති පෙරමුණේ නිර්මාතෘ විජේවීර සහෝදරයා ගේ අතපය වලට වෙඩි තබා ජීවිත දානය ඉල්ලද්දී බොරැල්ල ආදාහනාගාරයේ අමු අමුවේ පුලුස්සා මරා දැමුවේ එවකට රන්ජන් විජේරත්න එ.ජා. පක්ෂයේ ආරක්ෂක ඇමති වී සිටියදී වීම සෝමවංශට අමතක වූයේ කෙසේද? එද සෝමවංශ අමරසිංහ මහතා කිඹුල්කඳුලු වැගුරුවේ එ.ජා. පක්ෂයට ශාප කරමිනි. එහි ප්‍රතිඵලයක් වූයේ සෝමවංශ බේරීම සඳහා හොර රහසේ ඉන්දියාවට පැනයාමයි. විජේවීර සහෝදරයාගේ පාඩම වූයේ මෙයද? සෝමවංශ සොයන විමුක්තිය මෙයද?

මෙවැනි තත්වයක් යටතේ රටට දැයට ආදරය කරන බුද්ධිමත් ජනතාව මෙවර ජනාධිපතිවරණයේදී ඔවුන්ගේ කෘතගුණ සැලකීමේ යුතුකම මනාව පෙන්නුම් කලේ ප්‍රතිපත්තියක් නොමැති දේශපාලුවන්ට පාඩමක් උගන්වමින්ය. උතුරු, නැගෙනහිර ජන්ද සියල්ලක්ම පාහේ හිමි වූයේ පොන්සේකා මහතාටයි. එයට ප්‍රධාන හේතුව මනෝ ගනේෂන් සම්බන්ධන් රනිල් සහ ෆොන්සේකා මහතා සමග ගිවිසගත් ගිවිසුම නොවේද? පොන්සේකා මහතා ජන්ද 40 ලක්ෂයක්ම ලබාගත්තේ මුලු රටම රවටමින් අඩුම තරමින් ඔහුගේ ජන්දයවත් නොමැතිවයි. ලොව ප්‍රථම වතාවට තම ජන්දය අහිමි ජනාධිපති අපේක්ෂකයකු ලෙස පොන්සේකා මහතා ඉතිහාස ගත වන්නේය.

ජනාධිපතිවරණය නිමා වුවත් මහා මැතිවරණයද අත ළඟය. ගුවන් විදුලි මාධ්‍ය මෙන්ම අනෙකුත් මාධ්‍යන් ඔස්සේ බොහෝ දේ ප්‍රචාරය වෙමින් අප සවන් පිරෙමින් පවතී. ජනාධිපති වරණයේ මෙන්ම මෙවර මහා මැතිවරණයේදීත් මහින්ද රාජපක්ෂ මහතාට එල්ල වී ඇති බරපතල චෝදනාව වන්නේ රාජපක්ෂ පවුල රාජ්‍ය දේපල සොරා ගන්නේය යන්නයි. රාජපක්ෂ පවුල් මෙම චෝදනාවන්ට වැරදිකරුවන් වන්නේ නම් ඔවුන්ට එරෙහිම නීතිමය ක්‍රියා මාර්ග නොගන්නේ ඇයි? ඊට හේතුව රාජපක්ෂ පවුල නිවැරදි කරුවන් නිසාද? එමෙන්ම අද අලුත්ම චෝදනාව වන්නේ හිටපු හමුදාපති සරත් පොන්සේකා මහතා හමුදා අත් අඩංගුවට ගැනීමයි. රජයක් පෙරළීමට කවරකු හෝ තැත් කලේ නම් රටක නායකයින් බුද්ධිමතුන් ඝාතනයට රාජදෝහීව කුමන්ත්‍රණය කලේ නම් පුද්ගලයා කවර තරාතිරමක වුවද නීතියේ රැහැනට අසුවිය යුතුය. ඒ සඳහා එරට නීතිය නිත්‍යානුකූලව අපක්ෂපාතීව කටයුතු කළ යුතු වන්නේය.

Melbourne නුවර ජීවත් වන ශ්‍රී ලාංකික සිංහල ප්‍රජාවගේ මහගෙදර නමින් හඳුන්වා ගන්නා 3zzz සිංහල ප්‍රජා ගුවන්විදුලිය මේ පරිසරයේදී පක්ෂග්‍රාහීව කටයුතු කිරීම මුලු මුලු මහත් ඕස්ට්‍රේලියානු සිංහල ප්‍රජාව හෙලා දකින්නේ ඉතා පිළිකුලෙනි. ඕස්ට්‍රේලියානු රජය මගින් අප සිංහල ප්‍රජාවට මෙම ගුවන් විදුලිය ලබාදී ඇත්තේ අප සිංහල භාෂාව, සාරධර්ම, සංස්කෘතිය රැකගෙන මතු පරපුර වෙත ඉදිරියට ගෙනයාම මිස වෛරී දේශපාලනික න්‍යායයන් ගුවන් තරංග ඔස්සේ සවන් ගත කිරීමට නොවන බව දැන්විය යුතුය. දරුවන් සඳහා වු ළමා වැඩසටහන්, අද දේශපාලන සංවාද වලට අලුවි ඇත. ප්‍රසන්න නාමල් තුරුකුලරත්න ගේ විමසුම ශ්‍රී ලාංකීය උරුමය, ඉතිහාසය, ගුවන් විලුලි නාට්‍ය සුන්දරත්වය කියා පෑවේ සිත් සතන් පිනවමිනි. ඒ වෙනුවට අද විකෘති වූ මනසක් ඇති මානසික උම්මත්තයකුගේ අඟුරු කබලක් දසදෙස විසුරුවා හරින්නේ අප සිංහල ප්‍රජාවගේම හදවත් දවා අළුකරමිනි. වෛරය, ක්‍රෝධය, පලිගැනීම මූලික පදනම වූ අඟුරු කබල විකාශයට අනුබල දුන්නේ ද කොන්ද පණ නැති මානසික

*ධර්මවර්ධනලාගේ පුද්ගලික දේශපාලනය සිංහල සේවය අසන අපට බලෙන් අසන්නට සළස්වන 3zzz සිංහල ප්‍රජා ගුවන් විදුලියට අරක් ගත්තවුන් මෙම ගුවන් විදුලිය ඔවුන්ගේ පටු දේශපාලන පරමාර්ථ ඉටුකර ගැනීමට යොදා ගන්නේ මෙය ඔවුන්ගේ පෞද්ගලික දේපලක් යැයි සිතාගනිමින් විය යුතු ය*

උමන්තකයෝයි. විමසුමට කටුව ගැසූ මේ පිස්සන් අද මේ කරමින් සිටින්නේ කුමක් ද?

පසුගිය 14 වැනිද 3zzz ගුවන් විදුලියේ ඉරිදා වැඩ සටහනේ නිවේදකයා සිරිල් ධර්මවර්ධන හා දේශපාලන සංවාදයට මුල පිරුවේ කලාව මූලික කරගෙනය. සිරිල් ධර්මවර්ධන සරත් පොන්සේකා මහතාට කඩේ යන්නට ඕස්ට්‍රේලියාවට පැමිණ ඇතිබව වැටහුනේ සංවාදය මදක් දුරක් යනවිටය. සිරිල් ධර්මවර්ධන පවසන්නේ අද ශ්‍රී ලංකාවේ මිනිස්සු මරන්නේ බල්ලෝ බලල්ලු වාගේ කියායි. එය ඔහු පැවසුවේ කිසිම වගකීමකින් තොරවය. මිනීමරු දේශපාලනයේ පුරෝගාමීයෝ කවුරුද? තරුණ මළ සිරුර ගංගාවල පාවුනේ, හංදියක් හංදියක් පාසා තරුණ මළ සිරුර ටයර් සෑයන්වල අළු වුනේ තරුණ ජීවිතවල අවසානය ලයිට් කනුවල අවසන් වු යුගය සිරිල් ධර්මවර්ධන මහතාට අමතකද? නැතිනම් පැතිමාරුව නිසා අමතක කරලීමට උත්සාහ දරන්නේද? ප්‍රේමකීර්ති ද අල්විස්, විජය කුමාරතුංග , සාගරිකා ගෝමස්, රිවඩ්ද සොයියා ඒ අය මර දැමුවේ බල්ලෝ, බලල්ලු සේ නොවේද? කොළඹ සරසවියේ ත්‍රිමානවිතාන වැනි සරසවි සිසුන්ගේ ජීවිත දහස් ගනනක් මරා දැමීමේ කුමන ආන්දුවෙන්ද? මෙවැනි වටිනා ජීවිතවලට වගකිව යුත්තේ කවුරුන්ද? සිරිල් ධර්මවර්ධනට කලු බළල්ලු, කොළ කොට්ටි බටලන්ද වධකාගාරය අමතක වූයේ කොහොමද?

පසුගිය දිනවල මා ලංකාවේ සිටින කාලය තුල මා දැක්කේ බලු වෑන් එක වෙනුවට සුනඛයින්ගේ බෝම්ම වලක්වාලන සැත්කම් සඳහා සතුන්ව භාජනය කිරීමයි. ඒ සඳහා පශු වෛද්‍ය කණ්ඩායම් විදියක් විදියක් පාසා යන අයුරුයි. මිනිස් ජීවිතවලට හානියක් කිරීම තියා තිරිසනුගේ ප්‍රාණයක් නිරුද්ධ කිරීමට ඇති බලවත් ඇසකැත්ත, ජීවත් වීමේ අයිතිය තිරිසනකුට පවා ඇති බවත් මින් පෙන්වා දෙන්නේය.

සරත් පොන්සේකා මහතා ඔහුගේ දේශපාලන වේදිකාවේදී ජනතාව අමතා කියා සිටියේ ඔහු බලයට පත්වු පසු ඔහුට විරුද්ධව කටයුතු කල අයගෙන් පලිගන්නා බවයි. ඔහුගෙන් ඉදිරියේ රටට සිදුවන සේවාව, සංවර්ධන ක්‍රියාදාමයන් ඉස්මතු වුයේ ද නැත. සිරිල් ධර්මවර්ධන මහතානෙනි එය වෛරී දේශපාලන න්‍යාය ධර්මයක් නොවේද? ඔබ කියන ප්‍රජාතන්ත්‍රවාදය ඒතුල අන්තර්ගතවේද? රටක ජීවනාලිය බදු වටිනා කියන ගස්වැල් බිමදමා එම දැව දඬු වලින් තම නිවෙස්වල ජනෙල් දොරවල් අලංකාර කරගන්නා පුද්ගලයාත් වනසතුන් කුරිරු ලෙස මරා දමා දඩමස් ප්‍රියතම ආහාරය ලෙස බුදින පුද්ගලයාත් දේශප්‍රේමී වන්නේ කෙසේද? මුහුකුරා ගිය කලාකරුවකු වශයෙන් ඕස්ට්‍රේලියාව වැනි රටකට පැමිණ මෙවැනි පහත් සංවාදවල යෙදෙන්නේ කුමන අරමුණකින්ද?

අප මාතෘභූමියෙන් අෑත්ව සිටිණ ශ්‍රී ලාංකික ප්‍රජාවගේ හිතසුව පිණිස කටයුතු කරනු විනා මෙවැනි සීමිත පහසු කම් ඇති ගුවන් විදුලි මාධ්‍යයකින් මුළු මහත් සිංහල ප්‍රජාව භේදභින්න කර, කුපිත කිරීම, සිත්තැවුලට ලක්කිරීම කොයිතරම් දුරට යුක්ති සහගත වන්නේදැයි සිරිල් ධර්මවර්ධන මොහොතක් සිතා බැලිය යුතුය. ධර්මවර්ධනලාගේ පුද්ගලික දේශපාලනය සිංහල සේවය අසන අපට බලෙන් අසන්නට සළස්වන 3zzz සිංහල ප්‍රජා ගුවන් විදුලියට අරක් ගත්තවුන් මෙම ගුවන් විදුලිය ඔවුන්ගේ පටු දේශපාලන පරමාර්ථ ඉටුකර ගැනීමට යොදා ගන්නේ මෙය ඔවුන්ගේ පෞද්ගලික දේපලක් යැයි සිතාගනිමින් විය යුතු ය

මේ සඳහා වගකිව යුත්තේ අන්ධයන් බිරින් සේ සිටින්නේ ඔවුන්ට හරිහැටි මාධ්‍ය, සිංහල භාෂාව, පිළිබඳව අධ්‍යාපනික දැනුමක් නැති නිසාද? එසේත් නැතිනම් මාධ්‍යවේදීයකුගේ අපක්ෂපාතී වගකීම කුමක්දැයි හරිහැටි නොදන්නා කම නිසා නොවේද?

පිච්චි , පිච්චි දැවෙන අඟුරු කබල වෙනුවට දුම්මල කබල ගැනීමට කාලය එළඹ ඇත . 3zzz සිංහල ප්‍රජා ගුවන් විදුලියට අරක්ගන සිටින පෙරේතයින්, කුම්භාණ්ඩයින් පලවාහැර මෙල්බර්න් වාසී සිංහල ප්‍රජාවට, අප අනාගත දු දරුවන්ටත් අපේ මාතෘ භූමිය ශ්‍රී ලංකාවටත් වැඩදායික, අර්ථවත් ප්‍රජා ගුවන් විදුලියක් බවට පත් කර ගැනීමට පාඨකයින් වන ඔබ සතු වගකීමකි. ■

සංවාදයට විවෘතයි